## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# තනතුරු හා පුරප්පාඩු

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) තනතුරු 1939 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ)

**සේවා ගණය** : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01 – 2006 - ඒ)

**වැටුප් පරිමාණය** : රුපියල් 40,000-10X450-10X490-10X540-12X590 -රු. 61,880 (PL 1–2006 - (ඒ)) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන (II) අනුව) – (2026 වර්ෂයේ ආරම්භක වැටුප රු.38,863 වේ.)

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)

**හෝ**

තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි NVQ 3 මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක් ලබා තිබීම

**කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**වයස** : අවුරුදු 18 නොඅඩු – අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**බඳවා ගන්නා ශ්‍රේණිය** : බඳවාගනු ලබන්නේ සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) III ශ්‍රේණිය සඳහා පමණි.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

**සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(i) දැනට පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක වනුයේ කොළඹ, ගම්පහ, මහනුවර, නුවරඑළිය, ගාල්ල, යාපනය, අම්පාර, ත්‍රිකුණාමලය හා අනුරාධපුරය වන අතර බඳවා ගනු ලබන නිලධාරීන් සේවය කිරීමට කැමති ඉහත දිස්ත්‍රික්ක අතරින් දිස්ත්‍රික්ක 3ක් ප්‍රමුඛතාවය පරිදි පිළිවෙළින් සඳහන් කළ යුතු අතර, කුසලතාවය හා පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තෝරාගනු ලබන දිස්ත්‍රික්කය තුළ අනිවාර්යයෙන් වසර 5ක් සේවය කළ යුතුය. එම කාලය තුළ ස්ථානමාරු වීම් සළකා බලනු නොලැබේ.

(ii) තවද සේවා අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(iii) පත් කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුවේ. තවද, තෝරාගනු ලබන නිලධරයන් වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(v) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

(vi) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01–2006 -ඒ) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියටද (සම්පූර්ණ විස්තරය පහත වෙබ් සබැඳියෙන් ලබාගත හැක.) සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ

(vii) අයදුම්කරුවකු පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, එම අය විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

(viii) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**අයදුම් කරන ආකාරය :** සියලු අයදුම්කරුවන් තම අයදුම්පත වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සුදු A4 කඩදසියක පිළියෙල කර තම භාෂා මාධ්‍යයෙන්ම පැහැදිලිව සිය අත් අකුරින්ම සම්පූර්ණ කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 01 -2006 -ඒ) සේවා ගණය සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) තනතුර සඳහා බඳවාගැනීම - 2025" යනුවෙන් සඳහන් කර 2026.01.12 දිනට පෙර හෝ එදිනට ලැබෙන පරිදි අධ්‍යක්ෂ (පාලන) 04 ශාඛාව, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (WWW.health.gov.lk වෙබ් අඩවියෙන් හෝ පහත QR කේතය ස්කෑන් කිරීමෙන් අයදුම්පත බාගත කරගත හැක. එය A4 සුදු කඩදසියේ මුද්‍රණය කර අයදුම්පත පුරවා යොමු කළ යුතුය.)

**ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**සුවසිරිපාය**
**අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**

tamilguru.lk